# බළන්ගොඩ නගර සභාව

## 2018-08-08 දින මහ සභා වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2018-08-08**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. | ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. | ගරු නාගරික මන්ත්‍රී | අකිල එල්ලාවළ මැතිතුමා |
| 5. | ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 6. | ගරු නාගරික මන්ත්‍රී | ආර්. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 7. | ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා |
| 8. | ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 9. | ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා |
| 10. | ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 11. | ගරු නාගරික මන්ත්‍රී | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 12. | ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 13. | ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 14. | ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 15. | ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 16. | ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 17. | ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරී සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | ලේකම් | එස්.එච්.ඒ.කරුණාරත්න මිය |

**01. පසුගිය සභාවේ සභා වාර්තාව සම්මත කිරීම**

සභාපතිතුමා විසින් සභාවට දැනුම්දුන් අවස්ථාවේ ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් 2018.06.14 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රි ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් විසින් එය ස්ථිර කරන ලදුව පසුගිය සභාවේ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන**

ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමන් විසින් අදහස් දක්වමින් බලංගොඩ නගර සභාවේ ආසන 10 ය සංවර්ධනය සඳහා අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ ගරු අග්‍රාමාත්‍යතුමා ලක්ෂ 332 ට වැඩි මුදල් ප්‍රතිපාදන ලබා දී ඇති බවත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ලක්ෂ 200 ට ආසන්න මුදල් ප්‍රතිපාදන ලබා දී ඇති බවත් පවසා සිටි අතර, ඉදිරි මාසය තුළදී බලංගොඩ නගර සභා සීමාවේ සංවර්ධනය උදෙසා මෙලෙස ලක්ෂ 450 ක් 500 ක් අතර මුදලක ලබාදුන් අතිගරු ජනාධිපතිතුමාට හා ගරු අග්‍රාමාත්‍යතුමාට විශේෂ ස්තූතිය පල කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බව මෙහිදී පවසා සිටින ලදී.

**03. සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා /ලංසුපත් ඉදිරිපත් කිරීම**

● බළන්ගොඩ බස් නැවතුම්පොල පදික කඩ ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ප්‍රසිද්ධ ලංසුපත් කැඳවීමේදි ඉදිරිපත් වී ඇති ලංසුපත් අතරින් බළන්ගොඩ ,කිරිදිගල, සිරිළක්, අංක 28 හි සසිරි කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් සප්ලයර් ආයතනය විසින් ඉදිරිපත් කර ඇති රු.3,352,160.14 ක මුදල ඉංජිනේරු ඇස්තමේන්තුවේ වැඩ වටිනාකමට වඩා 3.89%ක අඩු බැවින් හා සියළු සුදුසුකම් සපුරා ඇති බැවින් ටෙන්ඩර් ඇගයීම් නිර්දේශයට අනුව බළන්ගොඩ බස් නැවතුම්පොල පදික කඩ ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු.3,352,160.14 ක මුදලට බළන්ගොඩ ,කිරිදිගල, සිරිළක්, අංක 28 හි සසිරි කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් සප්ලයර් ආයතනය වෙත ලබාදීමට ගත් තීරණය ගරු සභාව විසින් අනුමත කරන ලදී.

● බළන්ගොඩ නගරය පවිත්‍ර කිරීම සඳහා ප්‍රසිද්ධ ලංසුපත් කැඳවීමේදි ඉදිරිපත් වී ඇති ලංසුපත් අතරින් අවම ලංසුව වන රු.574,000.00 ක මුදල ඉදිරිපත් කල රුවන් කුට්ටියලාගේ ජයසුන්දර යන අය සියළු ටෙන්ඩර් සුදුසුකම් සපුරා ඇති හෙයින් ටෙන්ඩර් ඇගයීම් නිර්දේශයට අනුව බළන්ගොඩ නගරය පවිත්‍ර

කිරීම සඳහා වූ ටෙන්ඩරය රුවන් කුට්ටියලාගේ ජයසුන්දර යන අය වෙත ලබාදීමට ගත් තීරණය ගරු සභාව විසින් අනුමත කරන ලදී.

04. 04. ***04:01* කල් දී ඇති ප්‍රශ්න**

***04:01:01 බලංගොඩ කොළොන්න ජල ව්‍යාපෘතිය සඳහා ජල සම්බන්ධතා ලබාදීමේදි මාර්ගය පළුදු කිරීම වෙනුවෙන් තැන්පතු මුදල් ලබාගෙන තිබේද? (ගරු නාගරික මන්ත්‍රී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය)***

ගරු නාගරික මන්ත්‍රී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් විමසා ඇති පරිදි බලංගොඩ කොළොන්න ජල ව්‍යාපෘතිය සඳහා ජල සම්බන්ධතා ලබාදීමේදි මාර්ගය පළුදු කිරීම වෙනුවෙන් තැන්පතු මුදල් ලබාගෙන තිබෙන බවත්, එහිදී මාර්ග පළුදු කිරීම සඳහා ඇස්තමේන්තු කර ඇති මුළු මුදල වන රු.4,383,871.39 ක මුදලින් 50% ක් වන රු.2,191,935.69 ක මුදලක් තැන්පතු ලෙස ලබාගෙන ඇති බවත් ගරු සභාව දැනුවත් කරන ලදී.

***04:01:02 බලංගොඩ කොළොන්න ජල ව්‍යාපෘතිය සඳහා මාර්ග පළුදු කිරීම වෙනුවෙන් දැමූ කොන්දේසි මොනවාද? (ගරු නාගරික මන්ත්‍රී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය)***

ගරු නාගරික මන්ත්‍රී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් විමසා ඇති පරිදි බලංගොඩ කොළොන්න ජල ව්‍යාපෘතිය සඳහා මාර්ග පළුදු කිරීම වෙනුවෙන් දැමූ කොන්දේසි 24 ක් පවතින බවත් එම කොන්දේසි අඩංගු ලේඛනයේ ඡායා පිටපතක් දැනුවත් වීම සඳහා ලබාගන්නා ලෙසත් ගරු සභාපතිතුමන් විසින් පවසා සිටින ලදී.

**කල් දී ඇති යෝජනා**

***04:02 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා***

04:02:01 **ඉන්දුනීසියාවේ සුරබයා නගරයේ පැවැත්වෙන එක්සත් නගර සහ ප්‍රාන්ත ආසියා පැසිෆික් කලාප රැස්වීමට සහභාගි වීම.**

ඉන්දුනීසියාවේ සුරබයා නගරයේ 2018.09.11 දින සිට 2018.09.16 දින තෙක් පැවැත්වෙන එක්සත් නගර සහ ප්‍රාන්ත ආසියා පැසිෆික් කලාප රැස්වීමට සහභාගි වීම සඳහා ආරාධනා ලැබී ඇති බවත්, ඒ සඳහා එක් අයෙකුට රු.139,000.00 ක් පමණ මුදලක් වැයවෙන බවත්, පවසා සිටි ගරු සභාපතිතුමා එම මුදල සභා

අරමුදලින් යොදවා ගරු සභාපතිතුමා හා ගරු උප සභාපතිතුමා සහභාගි කරවීම සුදුසු බවට ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාව සඳහා විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:02 එල්.ඊ.ඩී. දැන්වීම් පුවරුවක් සවි කිරීම. (ඒ.එල්.එන්. ජයන්ත)**

එල්.ඊ.ඩී. දැන්වීම් පුවරුවක් සවි කිරීම සඳහා අවසර පතමින් ඒ.එල්.එන්. ජයන්ත මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම සඳහා අනුමැතිය ලබාදීමට ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් සථිර කරන ලදී.

මෙහිදී අදහස් පලකර ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා, බලගහමුල විලක් ඉදිකිරීම සඳහා ඉතිරිකර ඇති භූමි කොටසේ සභාව මගින් පාලනය කෙරෙන දැන්වීම් පුවරුවක් සවි කිරීම සුදුසු බව යෝජනා කරන ලද අතර ගරු සභාපතිතුමන් විසින් එම යෝජනාව ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් එම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:03 2018 ජාතික කියවීම් මාසය සඳහා සංවිධානය කල වැඩසටහන් සඳහා අනුමැතිය ලබාගැනීම.**

2018 ජාතික කියවීම් මාසය සඳහා සංවිධානය කල වැඩසටහන් සඳහා සභාවේ අනුමැතිය පතමින් ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සඳහා විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:04 පුස්තකාලයේ අඩුපාඩු සකස් කර ගැනීම.**

පුස්තකාලයේ අඩුපාඩු සකස් කර ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනා අතරින් කෞතුකාගාරයට භාන්ඩ ලබා ගැනීම හා යතුරු දැමීමට හැකි වීදුරු මේස සවිකිරීම හා පුස්තකාල පාඨකයින්ට ආහාර ගැනීමට සුදුසු එළිමහන් ස්ථානයක් සකස් කිරීම සඳහා පුස්තකාල උපදේශන කමිටුවේද යෝජනා ස්ථිර වූ පරිදි ගරු සභාවේ

අනුමැතිය පතමින් ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:05 සේවා ගිවිසුම් අළුත් කිරීම. (පී.ආර් ශ්‍යාමා මිය / එම්.ඩී.ජයන්ති පෙරේරා මිය)**

බලංගොඩ නගර සභාවේ සේවයේ නියුතු සෞඛ්‍ය කම්කරු පී.ආර් ශ්‍යාමා මිය හා පෙර පාසල් පාලිකා එම්.ඩී.ජයන්ති පෙරේරා මියගේ සේවා ගිවිසුම් පිළිවෙලින් 2018-09-07 වන දිනෙන් සහ 2018-09-15 වන දිනෙන් අවසන් වීමට නියමිත බැවින් , ඉදිරි වර්ෂය සඳහා ඔවුන්ගේ සේවා ගිවිසුම් අළුත් කිරීමටත්,ඔවුන් නැවත සේවය සඳහා බඳවාගැනීමටත් සහා අනුමැතිය පතමින් ගරු සභාපතිතුමන් විසින් ඉදිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව සභාවේ විරෝධතා නොමැති හෙයින් ඒකමතිකව සම්මත විය.

04:02:06 **2017.12.31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබද වූ විගණකාධිපති වාර්තාව**

2017.12.31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබද වූ විගණකාධිපති වාර්තාව සඳහා සභාවේ අනුමැතිය පතමින් ගරු සභාපතිතුමා විසින් ඉදරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.මෙහිදී බලංගොඩ නගර සභාවේ 2017.12.31 දිනට මූල්‍ය තත්තව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය,මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවලින් සමන්විත වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මෙහිදී විගණනය කොට ඇති බව ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට දන්වා සිටින ලදී.

මෙහිදි සභාවේ ගරු සභික පිරිස් විසින් විගණන මතය පිළිබඳ විමසා සිටි අවස්ථාවේ ගණකාධිවරයාගෙන් ඒ පිළිබඳ විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු උප සභාපතිතුමාගේ ස්ථිරත්වයෙන් සභාව කාරක සභා අවස්ථාවක් බවට පත්කරන ලදී.එහිදී ගණකාධිකාරි විසින් කරුණු පැවසූ පසු නැවත

කාරක සභාව ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු උප සභාපතිතුමාගේ ස්ථිරත්වයෙන් ගරු සභාවක් බවට පත්කරන ලදී. එහිදී සාකච්ඡවට බඳුන් වූ කරුණු පදනම් කර ගෙන ගරු සභාපතිතුමන් විසින් බලංගොඩ නගර සභාවේ මූල්‍ය තත්තවය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව පවසා සිටින ලදුව ඉහතින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:07 සභා අරමුදල් යොදවා පැතිබැම්ම ඉදිකර දීම. (බී.එම්.ජී.මල්ලිකා ජයවර්ධන)**

අංක 36,කොටුගොඩැල්ල, බලංගොඩ ලිපිනයේ පදිංචි බී.එම්.ජී.මල්ලිකා ජයවර්ධන යන අය විසින් ඉල්ලීම් කර තිබූ අවශ්‍යතාවය සළකා බලා මාර්ගයෙන් ගලා බසින ජල පහර නිසා ප්‍රධාන මාර්ගයට හා නිවසට සිදුවන හානිය වැළැක්වීම සඳහා අවශ්‍ය පැතිබැම්ම ඉදිකර ගැනීම සඳහා අවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍යයන් සහා අරමුදල් යොදවා ලබාදීමට සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් මෙය පුද්ගලික බැම්මක්ද, පොදු බැම්මක්ද යන්නත් ස්ථානීය පරික්ෂාවක් සිදු කර ඇස්තමේන්තු සකස් කර තිබේද යන්නත් විමසා සිටින ලද අතර ඒ සඳහා පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමන් මෙය පුද්ගලිකව ඉදිකරන බැම්මක් වුවද මෙහි සිදුකරන ලද නිරීක්ෂන චාරිකාවේදි හදුනාගත් පරිදි ප්‍රධාන මාර්ගයේ කාණුවෙන් ගලා බසින ජලය නිවස කරා යාමෙන් එම ස්ථානය මඩ වෙන අතරම ප්‍රධාන මාර්ගය කැඩී කැඩී විනාශ වීම වළක්වා ගැනීම පිණිස මෙය ඉටුකරන බව පවසා සිටින ලදී.

විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

හදිසි යෝජනා

**04:02:08 බස්නැවතුම්පොළ කාර්පාක් හා සාප්පු කඩකාමර කුළී තක්සේරුව අඩුකිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමියගෙන් ඉල්ලාසිටීම.**

බස්නැවතුම්පොළ කාර්පාක් හා සාප්පු කඩකාමර කුළී තක්සේරුව අඩුකිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමියගෙන් ඉල්ලාසිටීම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ලාල්

ගලප්පත්ති මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් පල කරන ලද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා මෙම තක්සේරුව ක්‍රියාත්මක වීම හේතුවෙන් කඩකාමර හිමියන්ට වන අසාධාරණය පිළිබද සභාවේ සියළුදෙනා එක්වී ගරු ආණ්ඩුකාරතුමිය දැනුවත් කර එම කුළී මුදල් අඩුකර ගැනීම සුදුසු බවට මෙහිදී අදහස් පළකරන ලදී.

මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා දැනට නව තක්සේරුව පරිදි ගිවිසුම් අත්සන් කිරීම අඛන්ඩව සිදු කරගෙන යාමටත්, පොදු වෙළෙඳ සැල් හා කීමනි කඩකාමර කුළිය වැඩිවීම සම්බන්ධව පෙන්වා දී එම කුළිය අඩුකර දෙන මෙන් ගරු ආණ්ඩුකාරතුමිය දැනුවත් කර ලිපියක් සකස්කිරීම සුදුසු බව පවසා සිටින ලදී.

එහිදී අදහස් පලකරන ලද ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා, ගරු ආණ්ඩුකාරතුමිය දැනුවත් කර සාදන ලිපියේ අන්තර්ගත විය යුතු කරුණු පිළිබඳ ඉතා සැලකිලිමත් වන ලෙසත්, මීට කලින් එසේ සකස්කර යවන ලද ලිපිවල යම් යම් අඩුපාඩු පවතින බවත් පවසා සිටි අතර මෙවර ගරු ආණ්ඩුකාරතුමිය දැනුවත් කර සාදන ලිපියේ පිටපතක් ගරු සභික පිරිස් වෙත එහි අන්තර්ගතය පිළිබඳ දැනුවත් වීම සඳහා ලබාදෙන ලෙසත් පවසා සිටින ලදී.
මෙහිදී ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන් විසින් අදහස් දක්වමින් පළාත් පාලන කොමසාරිස් හරහා ආණ්ඩුකාරතුමිය වෙත ලිපිය යැවීමේදි පෙර පරිදිම තත්වය වෙනස් නොවීමට ඉඩකඩ ඇති හෙයින් ගරු සභාවේ සභිකයන් 17 දෙනා එක්වී ගන්නා තීරණය සෘජුව ආණ්ඩුකාරතුමිය හමුවී දැනුවත් කිරීම සුදුසු බව පවසා සිටින ලදී.

මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා නෛතික ක්‍රමවේදය අනුව ආණ්ඩුකාරතුමිය වෙත ලිපිය යා යුත්තේ කොමසාරිස් හරහා බැවින් කටයුතු එසේ සිදුකිරීම සුදුසු බවත්,සභාවේ ආදායම පිළිබදව මෙහිදී සැළකිලිමත් වි තීරණ ගත යුතු බවත් පවසා සිටි අතර මේ පිළිබඳව වැඩිදුරටත් සාකච්ඡා කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් ගරු උප සභාපතිතුමාගේ ස්ථිරත්වයෙන් සභාව

කාරක සභාවක් බවට පත්කරන ලදී. එහිදී අදාල නිළධාරින් සමග කරුණු සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් ගරු උප සභාපතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත ගරු සභාවක් බවට පත්කරන ලදී.

එහිදී සාකච්ඡා වූ කරුණු ද සළකා බලා නවනගරය සංක්‍රමණය වීම හේතුවෙන් පොදු වෙළෙඳසැල් කඩ කාමර සඳහා උද්ගත වූ අසාධරණ තත්වය හා කීමනි කඩකාමර සඳහා කුළී වැඩිවීම හා ටෙන්ඩර් කඩකාමර සඳහා කුළී අඩුවීම යන හේතු සාධක පිළිබඳවද සළකා බලා සභාවේ ගරු සභික පිරිස් විසින් ඉදිරිපත් කරන ලද අදහස්ද සළකා බලා ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් කරන ලද යෝජනාවට හා ගරු නාගරික මන්ත්‍රි වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කල පරිදි සමහරක් කඩ කාමර සඳහා තක්සේරුව සාධාරණ වන අතර සමහරක් කඩ කාමර සඳහා තක්සේරුව විශාල ලෙස වැඩි වී තිබෙන බැවින් එම අසාධාරණයට ලක් වූ කඩ කාමර සඳහා තක්සේරුව අඩුකරන මෙන් දන්වා ගරු ආණ්ඩුකාරතුමිය වෙත දන්වා යැවීමටත්, එතෙක් ඉතිරි ගිවිසුම් අත්සන් කිරීමටත් සුදුසු බව ගරු සභාපතිතුමා විසින් පවසා සිටින ලදී.
විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:09 විදේශගතව සිටින බස් නැවතුම්පොළ කී මනි කඩහිමියන්ගේ ගිවිසුම් අත්සන් කිරීමේ බලය දිවුරුම් ප්‍රකාශයක් මගින් පවුලේ ඥාතිවරයකුට පැවරීම**

විදේශගතව සිටින බස් නැවතුම්පොළ කී මනි කඩහිමියන්ගේ ගිවිසුම් අත්සන් කිරීමේ බලය දිවුරුම් ප්‍රකාශයක් මගින් පවුලේ ඥාතිවරයකුට පැවරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූම් මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මෙහිදි අදහස් පලකරන ලද ගරු උප සභාපති එම්.ටී.එම්.රූම් මැතිතුමා විසින් බස් නැවතුම්පොළ කී මනි කඩහිමියන් කිහිප දෙනෙකුම විදේශගතව සිටින බැවින් ගිවිසුම් අත්සන් කිරීමට නොහැකි තත්වයක් ඇති නිසා ඒ සඳහා පවුලෙ ඥාතිවරයකුට බලය පැවරීමේ වැදගත් භාවය පිළිබඳව

කරුණු පැහැදිලි කරන ලදී.මෙම යෝජනාව සඳහා විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව  සම්මත විය.

**04:02:10 බලංගොඩ ආනන්ද මෛත්‍රිය මධ්‍ය මහා විද්‍යාලයේ ගීරස වියමන් වැඩසටහන විනෝද බද්දෙන් නිදහස් කිරීම.**

බලංගොඩ ආනන්ද මෛත්‍රිය මධ්‍ය මහා විද්‍යාලයේ ගීරස වියමන් වැඩසටහන විනෝද බද්දෙන් නිදහස් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රි වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රි අකිළ එල්ලාවල මැතිතුමා අදහස් දක්වමින් පාසල් භූමිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට හා පාසල අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් බැවින් විනෝද බදු අයකර ගැනීම සදාචාරාත්මක නොවන බව පවසා සිටින ලදී. එයට පිළිතුරු ලබාදුන් ගරු  සභාපතිතුමා විනෝද බදු අයකර ගැනීමේ හැකියාව නගර සභාව සතු බව පවසා සිටින ලදී.

මෙහිදී අදහස් පලකරන ලද ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමළසිරි මැතිතුමා විසින් අදහස් දක්වමින් මෙම කාර්යය පාසලේ සංවර්ධනය සඳහා සිදු කරන වැඩසටහනක් බැවින් සහනයක් ලබාදීම වෙනුවෙන් විනෝද බද්දෙන් නිදහස් කිරීම සුදුසු බව පවසා සිටින ලදී.

එහිදී අදහස් පලකල ගරු සභාපතිතුමා බලංගොඩ ආනන්ද මෛත්‍රිය මධ්‍ය මහා විද්‍යාලයේ ගීරස වියමන් වැඩසටහන  සඳහා විනෝද බදු නිදහස් කිරීමටත්.බැනර් කටවුට් සඳහා පමණක් අයකර ගැනීම සුදුසු බවටත් ගෙනා යෝජනාව සනාථ කරමින් අදහස් පලකරන ලද ගරු නාගරික මන්ත්‍රි වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින්  ඉහත යෝජනාව ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් සභාවේ ඒකමතිකව සම්මත විය.

## 05. මන්ත්‍රි යෝජනා

***05ඃ01 ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණි වීරසිංහ මැතිතුමා***

05ඃ01ඃ01 අප ආයතනයේ පවත්වාගෙන යන ආයුර්වේදය විධිමත් කර බදු ගෙවන ජනතාවට සේවයක් සැපයීම.

05ඃ01ඃ02 එක්සත් ජනතා නිදහස් සන්ධාන පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එක්ව ලබා දුන් ගම්පෙරළිය සංවර්ධන මුදල් යොදවා කඩිනමින් නගරයේ සංවර්ධනයට යොදා ගැනීම.

05ඃ01ඃ03 තානායමට පිවිසෙන මාර්ගයේ අධික වර්ෂාවට කැඩී ගිය බැම්ම සහ තානායම් භූමිය සංවර්ධනය කිරීම.

05ඃ01ඃ04 මෙම වර්ෂයට මන්ත්‍රීවරුන්ට ලබා දෙන පෞද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන සඳහා ඉල්ලීම් කළ යෝජනා කඩිනමින් ලබා දීම.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනා ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී . ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින් අදහස් දක්වමින් බලංගොඩ නගර සභාව මගින් පවත්වාගෙන යන ආයුර්වේදය විධිමත් කර,අමතර උපස්ථායකවරුන් යොදවා,රෝගීන් නේවාසිකව නවත්වාගනිමින්, බදු ගෙවන ජනතාවට විධිමත් පහසුකම් සහිත ආයුර්වේදයක් ඇති කිරීම ඉතා මහඟු කර්තව්‍යයක් බැවින් ඉදිරියේදී තම පක්ෂයට ලැබෙන මුදල් ප්‍රතිපාදන යොදවා එය ඉටුකිරීමට අපේක්ෂිත බවත් එයට ගරු සභාවේ සහයෝගය ලබාදෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.

එමෙන්ම එක්සත් ජනතා නිදහස් සන්ධාන පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එක්ව ලබා දුන් ගම්පෙරළිය වැඩසටහනේ සංවර්ධන මුදල් ලද විගස එම මුදල් යොදවා කඩිනමින් නගරයේ සංවර්ධනයට යොදා ගන්නා ලෙස පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් තානායමට පිවිසෙන මාර්ගයේ අධික වර්ෂාවට කැඩී ගිය බැම්ම සහ තානායම් භූමිය සංවර්ධනය කිරීමේ වැදගත් භාවය පිළිබඳ කරුණු දක්වා සිටි අතර මෙම වර්ෂයට මන්ත්‍රීවරුන්ට පෞද්ගලිකව ලබා දෙන සභා මුදලින් කළ යෝජනා කඩිනමින් ලබා දීමට කටයුතු කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී.විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

*05ඃ02 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා*

05ඃ02ඃ01 පළාත් පාලන ආයතන වල විවිධ ආකාරයෙන් නීතිය හා කඩකුලී තක්සේරු ක්‍රියාත්මක වීමෙන් ඇති වන අසාධාරණය ගැන කරුණු යෝජනා කිරීම.

05ඃ02ඃ02 සභාවට යෝජනා ඉදිරිපත් කලද කිසිදු යෝජනාවක් මේවන විට ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් ගරු සභාව තුළ විරෝධතා යෝජනාවක් ගෙන ඒම.

05ඃ02ඃ03 2018 අයවැය මගින් මා හට ලැබී ඇති මුදල් ප්‍රතිපාදන වලින් කිවුලවෙල අමිත මහතාගේ නිවාස මාර්ගය සංවර්ධනයට යෝජනා කිරීම. ( රු.400,000 /- )

05ඃ02ඃ04 බැංකියවත්ත පරණ ජල ටැංකිය මාර්ගයේ කසළ එක්රැස් කරන ට්‍රැක්ටරය දෙවතාවක් යැවීමට යෝජනා කිරීම .

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා පළාත් පාලන ආයතන වල විවිධ ආකාරයෙන් නීතිය හා කඩකුලී තක්සේරු ක්‍රියාත්මක වීමෙන් ඇති වන අසාධාරණය ගැන කරුණු යෝජනා කිරීමට අපේක්ෂාවෙන් ආ බවත් ඒ සඳහා ඊට පෙරම පළාත් සභා නිළධාරීන් විසින් වැඩසටහනක් මගින් කරුණු දක්වූ නමුදු ලොව කිසිදු පළාත් පාලන ආයතනයක නැති දෙයක් ප්‍රායෝගිකව සිදු කිරීමේ අපහසුතාවයක් පවතින බවත් පවසා සිටින ලදී.

එමෙන්ම රත්නපුර නගර සභාවේ වසර 25 න් තක්සේරුව සිදුකර නොමැති අතර එහිදී නිළධාරීන් ඒ බව පෙන්වා දී හෝ උපදෙස් දී නොමැති අතර කිසිවෙකුට අධිභාර හෝ උසාවි යාමට සිදුවූ බවක් අසන්නට ලැබී නැති බවත් පවසමින් මෙම කඩකුළී අඩුකර ගැනීමේ ප්‍රයත්නය මහජන නියෝජිතයන් ලෙස මහජනතාවට සේවය කිරීමේ අටියෙන් සියළුදෙනා එක්වී සද්භාවයෙන් සිදු කිරීම තුළින් අධිභාර ඇතිනොවන බව පවසා සිටින ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් විසින් මෙය පළාත් පාලන ආයතන වල විවිධ ආකාරයෙන් නීතිය හා කඩකුලී තක්සේරු ක්‍රියාත්මක වීමෙන් ඇති වන අසාධාරණය ගැන කරුණු යෝජනා කිරීමක් පමණක් ද යන්නත් කඩකුළී තක්සේරුව අඩුකර ගැනීමේ යෝජනාවක් නොවේද යන්නත් විමසා සිටි අවස්ථාවේ පිළිතුරු ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා විසින් මෙය මෙම තක්සේරුව නිසා අසාධාරණයට ලක් වූ පාර්ශව සඳහා සාධාරණයක් ඉටු කර ගැනීමේ අපේක්ෂාවෙන් ගෙන ආවක් බවත්, තක්සේරුව අඩුකර ගැනීම සඳහා සභාවේ මැදිහත් වීම බලාත්මක මදි බව හැගුන හෙයින් සභාවේ සියළු සභිකයන් එක්වී මෙම තක්සේරුව නිසා අසාධාරණයට ලක් වූ පාර්ශව සඳහා සාධාරණයක් ඉටුකර දෙන මෙන් නැවත ලිපියක් සකස් කර ගරු ආණ්ඩුකාරතුමිය දැනුවත් කිරීම සඳහා ක්‍රියා කරමු යන්න පවසා සිටින ලදී.
මෙහිදී ගරු සභාපතිතුමන් විසින් මෙම අසාධාරණයක් සිදු වූවායි පවසන කඩම්හියන් සඳහා සාධාරණයක් සිදුකර දෙන මෙන් ගරු ආණ්ඩුකාරතුමිය වෙත ලිපියක් ඉදිරිපත්කරන තෙක් ගිවිසුම් ගත වීමේ ක්‍රියාවළිය නොනවත්වා කරගෙන යා යුතු බවත් එසේ වීමෙන් තක්සේරුව යම් හෙයකින් අඩුවුවහොත් අසාධාරණයක් වීමට ඉඩ නොදෙන බවත් පවසා සිටින ලදුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

සභාවට යෝජනා ඉදිරිපත් කලද කිසිදු යෝජනාවක් මේවන විට ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් ගරු සභාව තුළ විරෝධතා යෝජනාවක් ගෙන ඒම පිළිබඳව අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා මන්ත්‍රී ප්‍රතිපාදන සඳහා වෙන් වූ ලක්ෂ 4 මුදල යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා හෝ කඩිනමින් ඉටුකර දෙන ලෙස පවසා සිටින ලදී. එහිදී තම 2018 අයවැය මඟින් තමා හට ලැබී ඇති මුදල් ප්‍රතිපාදන වලින් කිවුලවෙල අමිත මහතාගේ නිවාස මාර්ගය සංවර්ධනයට කරන ලද යෝජනාව ක්‍රියාත්මක කර දෙන ලෙසත්,කිවුලවෙල මාර්ගය අඩි 6 නිසා ලේඛන ගත කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදී. එමෙන්ම බැංකියවත්ත පරණ ජල ටැංකිය මාර්ගයේ කසළ එක්රැස් කරන ට්‍රැක්ටරය සතියකට දෙවරක් එවන ලෙස ගම්වාසීන් විසින් කිහිප වතාවක් ඉල්ලීම් කර ඇති බවත්, බැංකියවත්ත පරණ ජල

ටැංකිය මාර්ගයේ කසළ එක්රැස් කරන ට්‍රැක්ටරය නැවත හරවා කොම්පෝස්ට් එකට යාමට නොහැකි ගැටළුවක් පවතින බව දැනගැනීමට ලැබුන නිසා ඒ පිළිබඳවද සොයා බලා සුදුසු ක්‍රමවේදයක් සකස් කර දෙන මෙන් පවසා සිටින ලදී.

මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා සභාවට යෝජනා ඉදිරිපත් කලද කිසිදු යෝජනාවක් මේවන විට ක්‍රියාත්මක නොවීම යන්න පිළිබද තමන් විසින් සම්පූර්ණ විරෝධතාවය ප්‍රකාශ කරන බවත්, ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ නියෝජනය කරන ලද මිය ගිය සුගත් මන්ත්‍රිවරයාට ගෞරවයක් වශයෙන් ඇල්ලෙපොළ කොට්ඨාශයට ප්‍රමුඛතාවය ලබාදී විශාල සංවර්ධන කාර්යය භාර්යයක් සිදු කර අවසන් බවත්, ඒ පිළිබඳ ඇස් දෙකෙන් දැක බැලීමට ආරාධනා කරන බවත් මේ වන විට බොහොමයක් යෝජනා සිදුකිරීමට ආරම්භ කර ඇති අතර යෝජනා කිහිපයක් සිදු කර අවසන් බව පවසා සිටින ලදී. එමෙන්ම නිරන්තරයෙන් නිළධාරින් සම්බන්ධ කර ගෙන අවශ්‍ය කටයුතු සිදු කරගන්නා ලෙසත්, යෝජනා සඳහා ප්‍රමුඛතාවය සභාවෙන් සභාවට වෙනස් නොකරන ලෙසත් පවසා සිටි ගරු සභාපතිතුමා ඉහත අවසානයේ ඉදිරිපත් කර ඇති යෝජනා දෙක පිළිබඳ ගම්වාසීන්ගේ අවශ්‍යතාවය පිළිබදව සලකා බලා ඉදිරියේදි පිළියමක් ගැනීමට අපේක්ෂා කරන බව පවසා සිටින ලදුව සභාවේ විරෝධතා නොමැති හෙයින් එම යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05ඃ03 ගරු නාගරික මන්ත්‍රි ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා***

05ඃ03ඃ01 කිරිඳිගල කළුඇල්ලකැලේ ගමෙහි පහළ ප්‍රදේශයට පානීය ජලය ලබා දීම.

05ඃ03ඃ02 නගර සභා සීමාව තුළ උසස්පෙළ සමත්ව විශ්ව විද්‍යාලයට ඇතුළත් වන සිසුන් සඳහා ශිෂ්‍යත්ව ලබා දීම.

ගරු නාගරික මන්ත්‍රි ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රි ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. මෙහිදි අදහස් ප්‍රකාශ කල ගරු නාගරික මන්ත්‍රි ඊ.ඒ. ජයන්ත ප්‍රේමකුමාර

මැතිතුමන් විසින් අදහස් දක්වමින් කිරිඳිගල කළුඇල්ලකැලේ ගමෙහි පහළ ප්‍රදේශයේ නිවාස 15 කට පමණ පානීය ජල ගැටළුවක් පවතින බවත් එයට විසඳුමක් ලබාදීම සඳහා තම ප්‍රතිපාදන යටතේ ඇති ඉතිරි මුදල් ඒ සඳහා වෙන්කරන ලෙසත් ඉල්ලා සිටින ලදී. තව දුරටත් අදහස් ප්‍රකාශ කරමින් පෙර සභාවකට ඉදිරිපත් කර යෝජනා අනුමත කරන ලද ගල්පල්ල අරාව මාර්ගය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු සකස්කර අවසන් වූ නමුත්, එහි චෙක් පත නොලැබීම පිළිබඳ විමසා සිටි අවස්ථාවේ ගරු සභාපතිතුමන් විසින් පිළිතුරු ලබා දෙමින්, ගරු ඇමතිනි තළතා අතුකෝරාළ මැතිණිය විසින් මේ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කර ඇති බව පවසා සිටින ලදි. මෙහිදී අදහස් පලකරන ලද ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ. ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් තමන් විසින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා යෝජනා කිරීමේදි කිසිවෙකුත් ඒ සම්බන්ධ ඉදිරිපත් වී නොතිබූ බවත් එම ප්‍රදේශයේ ජනතාවට දුන් පොරොන්දුවක් වශයෙන් තමන් ඔවුන් ඉදිරියේ අපහසුතාවයට පත්වෙන බවත් මහජන නියෝජිතයෙක් වශයෙන් වසර 25 ක් පුරාවට මහජනතාව උදෙසා සේවය කර ඇති අතර ඇස්තමේන්තු සකස් කර අවසන් වූ ව්‍යාපෘතියක් සඳහා එසේ හැල්ලුවට ලක් නොකරන ලෙසත් පවසා සිටින ලදී.

මේ සඳහා ගරු උප සභාපති එම්.ටී.එම්.රුම් මැතිතුමන් විසින් අදහස් දක්වමින් සභාවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් වන ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ. ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් සලකාබලා පක්ෂ භේදයෙන් තොරව එම ව්‍යාපෘතිය සඳහා එතුමාට අවශ්‍ය සහය ලබාදීම සුදුසු බවත් පවසා සිටින ලදී. මෙහිදී ගරු සභාපතිතුමන් විසින් මේ සඳහා අවශ්‍ය චෙක්පත ලබාදීමට එකගත්වය පල කරන ලදී.

නගර සභා සීමාව තුළ උසස්පෙළ සමත්ව විශ්ව විද්‍යාලයට ඇතුළත් වන සිසුන් සඳහා ශිෂ්‍යත්ව ලබා දීම නැවත ක්‍රියාත්මක කරන මෙන් ඉල්ලා සිටි ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ. ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා පෙර පැවති සභාවලදී මෙමගින් මහගු සේවයක් ඉටුකල බවත් මේ සඳහා නගරයේ වෙළෙඳ ප්‍රජාවගේ සහයෝගය ලබාගත හැකි බවත් පවසා සිටින ලදී. මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා මෙය නැවත ක්‍රියාත්මත කර එම ලබාදිය යුතු සුදුස්සන් ඉදිරිපත් කිරීමේ වගකීම අදාළ මන්ත්‍රීවරුන්ට ලබාදීම සුදුසු බවත් වර්ෂ අවසානයේ නගර සභාවේ පදිංචි ශිෂ්‍යත්ව

ලැබීමට සුදුස්සන් සඳහා ලබාදීම සුදුසු බව පවසා සිටින ලදුව ගරු සභාවේ විරෝධතා නොමැති හෙයින් ඉහතින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05:04 ගරු නාගරික මන්ත්‍රිනි ජී.චන්ද්‍රලතා මැතිතුමිය***

05:04:01 කෝපිවත්ත හුණුකුඹුර මාර්ගයේ රණවිනාවත්ත අතුරු මාර්ගයට එනම් සුනිල් කාහිංගල මහතාගේ නිවස අසල සිට එන්. කේ. නිල්මිණි සජීවනී මහත්මියගේ නිවස දක්වා මාර්ගයට ජලය තම පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන වලින් ලබා දීම.

05:04:02 සුදර්ශනගම කසල බැහැර කිරීමේ ක්‍රමවේදයට අවශ්‍ය කරන කටයුතු සලස්වා දීම.

ගරු නාගරික මන්ත්‍රි ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රි ඊ.ඒ. ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් තමන් විසින් පෙර සභාවලදී ඉදිරිපත් කර ඉටුකල දුන් යෝජනා සඳහා ස්තුතිවන්ත වන බවත් ,කෝපිවත්ත හුණුකුඹුර මාර්ගයේ රණවිනාවත්ත අතුරු මාර්ගයට එනම් සුනිල් කාහිංගල මහතාගේ නිවස අසල සිට එන්. කේ. නිල්මිණි සජීවනී මහත්මියගේ නිවස දක්වා පවුල් 13 ට පමණ ජල ගැටළුවක් පවතින බවත්, ඔවුන් දහතුන් දෙනාම ලිඛිතව කරන ලද ඉල්ලීමකට අනුව එම මාර්ගයට ජලය ලබාදී තම පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන වලින් සිදු කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

එමෙන්ම සුදර්ශනගම කසල බැහැර කිරීමේ ගැටළුව වසර ගණනාවක් සිට පැවතෙන්නක් බවත් තවමත් විසඳුමක් නොමැති කමින් එහි ජනතාව පීඩාවට පත්වන හෙයින්, නඩුහබවලට පවා පැටලී ඇති නිසාත් කසල ට්‍රැක්ටරය යැවීමට නොහැකි තත්වයක් ඇත්නම් ඒ සඳහා විකල්ප ක්‍රමවේදයක් සලසා දෙන මෙන් මෙහිදී ඉල්ලා සිටින ලදී.

මෙහිදී අදහස් පල කරන ලද ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ඉහතින් දැක්වූ හුණුකුඹුර මාර්ගයේ රණවිනාවත්ත අතුරු මාර්ගයට ජලය ලබාදීම සඳහා ගරු ඇමතිනි

තළතා අතුකෝරාළ මැතිතුමිය විසින් මේවන විටත් මුදල් ප්‍රතිපාදන වෙන්කර ඇති බවත් එහි මැනීම් කටයුතු පවා අවසන් බවත් පවසා සිටින ලදී.

මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු නාගරික මන්ත්‍රිනි ජී.චන්ද්‍රලතා මැතිතුමිය, තමන් විසින් සභාවේ යෝජනා සම්මත කරගන්නා ලද ගලඋඩ අතුරු මාර්ගය සඳහා ජලය ලබාදීමේ ව්‍යාපෘතිය සඳහා මෙවැනිම අකටයුතු සිදුකල බවත් පක්ෂ භේද මතුකර එවැනි දෑ සිදු කිරීමෙන් ඡන්දදායකයින් ඉදිරියේ අපහසුතාවයට ලක් වූ බවත්, පක්ෂ පාට ඉදිරියට දමා යෝජනා ඉදිරිපත් කිරීමේ අනන්‍යතාව නැති කිරීම සිදු නොකරන ලෙසත් ගම් වාසීන් විසින් ලිඛිතව ඉල්ලීම් කරන ලද රණවිනාවත්ත අතුරු මාර්ගයේ යෝජනාවටද එසේ නොකරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් ගමේ ප්‍රජාවන් අතර ගැටීම් ඇති කරගෙන ප්‍රශ්න ඇති කිරීමෙන් වළකින ලෙසත් ,සංවර්ධනය සඳහා ප්‍රතිපාදන ලැබේ නම් පක්ෂ භේදයෙන් තොරව ඒ පිළිබඳ සතුටු විය යුතු බවත්,වඩාත් වැදගත් වන්නේ අදාළ සංවර්ධන කටයුත්ත සිදු වීම බැවින් තමන්ට හිමි ප්‍රතිපාදන වෙනත් සංවර්ධන කාර්යයකට යෙදවීම සිදුකිරීම වඩාත් උචිත බවත් පෙන්වා දෙන ලදුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05ඃ05 ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා***

05ඃ05ඃ01 නගර සභාව වෙත ඩෙංගු මදුරුවන් බෝ වීම වැළැක්වීම සඳහා ධූමායන යන්ත්‍රයක් ලබා ගැනීම.

05ඃ05ඃ02 මන්ත්‍රී ප්‍රතිපාදන මඟින් නිවාස සෑදීම සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය ලබා දීම.

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා පසුගිය වකවානුවේ බුද්ධ ජයන්ති මාර්ගයේ හා නගරයේ කිහිප දෙනෙකුහට ඩෙංගු රෝගය වැළඳුන බවත් ,නගර සභාව සතුව ධූමායන යන්ත්‍රයක් තිබේ නම් කඩිනමින් ක්‍රියාත්මක වීමේ හැකියාව පවතින බවත් පෙන්වා දෙන ලදී.

එමෙන්ම ඕළුගංතොට කොට්ඨාශයේ ජනතාවට තම පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන යොදවා නිවාස ආධාර වෙනුවෙන් සිමෙන්ති හා ටකරන් ලබාදීමට අපේකෂා කරන බැවින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සකසා දෙන මෙන් ඉල්ලා සිටින ලදුව විරෝධතා නොමැති හෙයින් එම යෝජනා සභාවේ ඒකමතිකව සම්මත විය.

තව දුරටත් අදහස් දක්වමින් හුණුකුඹුර මාර්ගයේ රණවිනාවත්ත අතුරු මාර්ගයට ජලය ලබාදීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදෙන මෙන් ගරු ඇමතිනි තළතා අතුකෝරාළ මැතිතුමියගේ ලේකම් හමු වී ගම්වාසීන් කිහිප දෙනෙකු විසින් කරන ලද ඉල්ලීමක ප්‍රතිඵලයක් විනා ඒ පිටුපස වෙනත් පරමාර්ථයක් නොමැති බව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමන් විසින් පවසා සිටින ලදී.

***05:06 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා***

05:06:01 ළමා උයන අවට වාහන යා නොහැකි තරමට වළවල් හැරී තිබීම පිලිසකර කිරීම.

05:06:02 පිට්ටනිය අවට මඩවළවල් සෑදී ඇති කොටස් බැකෝ යන්ත්‍රය පාවිච්චි කොට ග්‍රෙවල් දමා මට්ටම්කොට පොළව තැලීම. මහජන පොළ දක්වා සංවර්ධනය කිරීම. ( විදුලි බුබුළු කණු සවි කරන අවස්ථාවේ කාණු හැරීම නිසා පස් ගොඩගැසී ඇත.)

05:06:03 දොරවෙල පාලම අසලින් වැටී ඇති පාර ගඟ සහ ක්‍රීඩා පිට්ටනිය අසලින් නව බස්නැවතුම්පොල දක්වා මාර්ගය සෑදීම.

05:06:04 ලංකා බැංකුව අසලින් ඇති මාර්ගය තුරු උයන අසලින් ''මොහාන් සාලිය එල්ලාවල මාර්ගයට '' යා කිරීමට දැනට පයින් ගමන් කළ හැකි මාර්ගයක් හෝ තැනීම.

05:06:05 මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය සඳහා පිළියමක් යෙදීම, ක්‍රීඩාංගනය නවීකරණයකිරීම, අසල ඇති කුණු කන්ද ඉවත් කිරීමට කටයුතු කිරීම (එම ඉඩමේ අයිතිය නගර සභාව සතු වීම නිසා )

05:06:05 කාර්පාර්ක් බිම කාපට් අසුරා සංවර්ධනය කිරීම.

05෴06෴07 කාර්පාර්ක් වෙළඳසැල් පේළිය පිටුපසින් ඇති කාණුව සංවර්ධනය කර දීම. (වෙළඳසැල් මැදින් ජලය බැස යන බැවින් )

05෴06෴08 සෙලාන් බැංකුව ඉදිරිපසින් ඇති දේශබන්දු මහතාගේ, චන්ද්‍රසේකර මහතාගේ සහ පැල්මඩුල්ල (සදිල්කා )ගෙස්ට් මාර්ගය වළවල් පුරවා හිල්සයිට් හෝටලය දක්වා සංවර්ධනය කිරීම.

05෴06෴09 මහජන බැංකුව අසලින් දෙවට පාරෙන් අතුරු මාර්ගය ලීල් මෝටර්ස් නිවසේ බැම්ම අසලින් ඇති මාර්ගය පයින් යාමට හැකි වන සේ සංවර්ධනය කර දීම.

05෴06෴10 තානායමට පිවිසෙන මාර්ගයේ මුල් කොටස කණු කැඩී ඇත. වළවල් හැරී ඇත. එම හංදිය බස්නැවතුම්පොළ අවට සංවර්ධනය කිරීම

05෴06෴11 ළමා උයන පිළිබඳ තවම පිළියමක් නැති හෙයින් ක්‍රීඩාංගනය භාර නිළධාරිතුමාට භාර දී වැඩිහිටියන් ඔවුන්ගේ වැඩ වලට පාවිච්චි නොකර කුඩා දරුවන්ට හවස් යාමයේ සෙල්ලම් කිරීමට සුන්දර ස්ථානයක් කිරීම.

05෴06෴12 නගරයේ වෙළඳ සංගමය වෙළඳ ව්‍යාපාරිකයින් සමඟ සාකච්ඡාවක් අවශ්‍යය බැවින් නීතිරීති සහ පිළිපැදිය යුතු කරුණු පිළිබඳ දැනුවත් කිරීම.

05෴06෴13 කරව්කැටිය මාර්ගයේ පැති කාණුව එක් පැත්තක් හෝ කොන්ක්‍රීට් ආවරණ කැලි දමා මාර්ගය සංවර්ධනය කර දීම.

උදේ පාසැල් කාලයේ වාහන විශාල ප්‍රමාණයක්, දහවල් පාසැල් කාලයේ වාහන විශාල ප්‍රමාණයක් ,හවස 4න් පසුව වෛද්‍ය සේවය පවතින කාලයේ වාහන විශාල ප්‍රමාණයක් ධාවනය වන බැවින් හා වාහන යනවිට පදිකයින්ට ගමන් කිරීමට ඉඩ නොමැති බැවින් කොන්ක්‍රීට් කැලි දමා පුළුල් කිරීම . දැනට සී.සී.දෙමළ විද්‍යාලය දක්වා හෝ සංවර්ධනය .

05෴06෴14 ජල ව්‍යාපෘතිය නිසා නගරයේ සියළුම මාර්ග අභාවයට ගොසින් නිසා ''කෙන්ට්'' ආයතනයට මාර්ග යථා තත්වයකට පත් කළ යුතු යැයි කියා දැනුම් දීම.

05෴06෴15 නගරයේ සෑම තැනම බෝර්ඩ් ප්‍රදර්ශනය කිරීම.

- ''ලෝකයේ ජීවත් වීමට සුදුසුම නගරයක් ''
- කුණු කසල හැමතැනම දමන්න එපා. - එය වරදක්.
- බුලත් කෙළ හැමතැනම දමන්න එපා. - එය වරදක්.
- පෝස්ටර් , දැන්වීම් හැමතැනම අලවන්න එපා. - එය වරදක්.
- තමතමන්ගේ හිතුමනාපෙට කිසිවක් වෙනස් කරන්න එපා. - නගර සභාවේ අදාල නිළධාරියා සමඟ සාකච්ඡා කරන්න වග බලා ගන්න.
- තම වෙළඳසැල අවට සහ ඉදිරිපස තමන් පිරිසිදු කර ගන්න. - පරිසර පොලිසිය සමඟ සම්බන්ධ වන්න.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.
මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් ළමා උයන අවට වාහන යා නොහැකි තරමට වළවල් හැරී තිබෙන කොටස් පිළිසකර කරන ලෙසත්, පිට්ටනිය අවට මඩවළවල් සෑදී ඇති කොටස් බැකෝ යන්ත්‍රය පාවිච්චි කොට ග්‍රෙවල් දමා මට්ටම්කොට පොළව තලා මහජන පොළ දක්වා සංවර්ධනය කිරීම සුදුසු බවත් පවසා සිටි අතර දොරවෙල පාලම අසලින් වැටී ඇති පාර ගඟ සහ ක්‍රීඩා පිට්ටනිය අසලින් නව බස්නැවතුම්පොල දක්වා මාර්ගය සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවයද ගරු සභාවට පෙන්වා දෙන ලදී.

ලංකා බැංකුව අසලින් ඇති මාර්ගය තුරු උයන අසලින් මොහාන් සාලිය එල්ලාවල මාර්ගයට යා කිරීමට දනට පයින් ගමන් කළ හැකි මාර්ගයක් සකස් කල හැකි නම් ලංකා බැංකුව මගින් තුරු උයන සංවර්ධනය සඳහා අනුග්‍රාහකත්වය ලබාදීමට කැමති බව සභාවට පවසා සිටි අතර කාර්පාර්ක් බිම කාපට් අසුරා සංවර්ධනය කිරීම පිනිස අවධානය යොමු කරන ලෙසත්, වෙළඳසැල් මැදින් ජලය බැස යන බැවින් කාර්පාර්ක් වෙළඳසැල් පේළිය පිටුපසින් ඇති කාණුව සංවර්ධනය කිරීම පිනිස අවධානය යොමු කරන ලෙසත් සෙලාන් බැංකුව ඉදිරිපසින් ඇති දේශබන්දු මහතාගේ, චන්ද්‍රසේකර මහතාගේ සහ පැල්මඩුල්ල (සදිල්කා )ගෙස්ට් මාර්ගය වළවල් හැරි ඇති බැවින් එම වලවල් පුරවා හිල්සයිට් හෝටලය දක්වා සංවර්ධනය කිරීම පිනිස අවධානය යොමු කරන ලෙසත්, මහජන බැංකුව අසලින් දෙවට පාරෙන් අතුරු මාර්ගය ලීල් මෝටර්ස් නිවසේ බැම්ම අසලින් ඇති මාර්ගය පයින් යාමට හැකි වන සේ සංවර්ධනය කර දීම පිනිස අවධානය යොමු කරන ලෙසත්,තානායමට පිවිසෙන මාර්ගයේ මුල් කොටස

කණු කැඩී වළවල් හැරී ඇති බැවින් එම හංදිය බස්නැවතුම්පොළ අවට සංවර්ධනය කිරීම පිනිස අවධානය යොමු කරන ලෙසත් මෙහිදී ඉල්ලා සිටින ලදි.

එමෙන්ම ළමා උයන ළඟ සුදු පොළක් වී ඇති බැවින්,පොලිසියද දැනුවත් කර එහි ආරක්ෂාවට ක්‍රීඩා භූමි මුරකරුගේ සේවය ලබාගන්නා ලෙස පවසා සිටි අතර නගරයේ වෙළඳ සංගමය වෙළඳ ව්‍යාපාරිකයින් විසින් බොහෝ වැරදි කිරීම දක්නට ඇති බැවින් ඔවුන් සමඟ සාකච්ඡාවක් කැඳවා ඔවුන් දැනුවත් කිරීම සුදුසු බවත්, කරව්කැටිය පාර එක් පැත්තක් හෝ කොන්ක්‍රීට් ආවරණ කැලි දමා බුද්ධජයන්ති මාර්ගය මෙන් සංවර්ධනය කිරීම පිනිස අවධානය යොමු කරන ලෙසත්, ජල ව්‍යාපෘතිය නිසා නගරයේ සියළුම මාර්ග අභාවයට ගොසින් නිසා ''කෙන්ට්'' ආයතනය දැනුවත් කිරීම තුළින් මාර්ග යථා තත්වයකට පත් කිරීම සඳහා අවධානය යොමු කරන ලෙසත් ඉල්ලා සිටි ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් නගරයේ සංවර්ධන කාර්යය සඳහා හරවත් වැකි සහිත පුවරු ප්‍රදර්ශනය කිරීමේ වැදගත් භාවය පිළිබඳ කරුණු ඉදිරිපත් කරන ලදී. සභාවේ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

### *05ඃ07 ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා*

05ඃ07ඃ01 ආනන්ද මෛත්‍රිය ජාතික පාසල් වටරවුම් මාර්ගයේ වැඩ නිම නොකල කොටසේ ඉදිකිරීම් කටයුතුවල කොන්ත්‍රාත්තුව දූනුමඩලගහ වත්ත ප්‍රදේශවාසීන්ගේ සුභසාධක සංගමය වෙත ලබාදීම.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු උප සභාපති එම්.ටී.එම්.රුම් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර ආනන්ද මෛත්‍රිය ජාතික පාසල් වටරවුම් මාර්ගයේ වැඩ නිම නොකල කොටසේ ඉදිකිරීම් කටයුතුවල කොන්ත්‍රාත්තුව දූනුමඩලගහ වත්ත ප්‍රදේශවාසීන්ගේ සුභසාධක සංගමය වෙත ලබාදීමට එතුමන් විසින් ගෙනා යෝජනාව සඳහා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05:08 ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමා***

05:08:01 බලංගොඩ වසම,බොම්බුව ප්‍රජා ශාලාව ඉදිරිපස ඇති අනාරක්ෂිත බැවුම සඳහා ආරක්ෂිත වැටක් ඉදිකිරීම.

05:08:02 වැ කුඹුර හා උඩකන්ද ගල්වල මාර්ගයේ සිට බෝම්බුව දක්වා වතුකාරගොඩ ඇතුළුව කුණු එකතු කිරීම සඳහා ට්‍රැක්ටරය යෙදවීම.

ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රි එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමන් විසින් බලංගොඩ වසමේ බෝම්බුව ප්‍රජා ශාලාව ඉදිරිපස ඇති අනාරක්ෂිත බැවුම සඳහා ආරක්ෂිත වැටක් ඉදිකිරීම ඉතා අත්‍යවශ්‍ය කරුණක් බැවින් ඒ සඳහා ගරු සභාවේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටි අතර වැ කුඹුර හා උඩකන්ද ගල්වල මාර්ගයේ සිට බෝම්බුව දක්වා වතුකාරගොඩ ඇතුළුව කුණු එකතු කිරීම සඳහා ට්‍රැක්ටරය යෙදවීමට හැකි නම් එය එම ප්‍රදේශයේ ජනතාවට කල හැකි විශාල මෙහෙවරක් බවත් ගරු සභාවේ කාරුණික අවධානය ඒ පිළිබඳව යොමු කරන ලෙසත් මෙහිදී ඉල්ලා සිටින ලදී. සභාවේ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05:09 ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය***

05:09:01 දෙවට පාරේ චන්න මහතාගේ නිවස අසළ තිබෙන කාණුවට ස්ලැබ් කැලි දමා ආවරණය කිරීම.

05:09:02 කරව්කැටිය හා උඩකන්ද පාර දෙපස කාණු දෙපැත්ත හා පාරට වැටී ඇති ගස් කොළන් ආදිය සුද්ධ කිරීමට එක් දිනකට කම්කරුවන් යෙදවීම.

05:09:03 නගරයේ ඇති කුඩා අඩුපාඩු සභාවට දැන්වීමෙන් පසු ඒ සඳහා හැකි ඉක්මනින් සේවක මහතුන් අධීක්ෂණයට යවා එදිනෙදාම කටයුතු කිරීම.

05:09:04 කරව්කැටිය මැද පාරේ කාණුව හා පාර සාදාගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීම (ශ්‍රම දායකත්වයෙන් සාදා ගැනීම සඳහා)

ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී මන්ත්‍රී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. මෙහිදී අදහස් පල කරන ලද ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් මෙතෙක් ඉදිරිපත් කරන ලද යෝජනා සඳහා ලබාදුන් දායකත්වය වෙනුවෙන් ස්තුතිවන්ත වන බව පවසා සිටින ලදී.

එමෙන්ම දෙවට පාරේ චන්න මහතාගේ නිවස අසළට තිබෙන කාණුවට ස්ලැබ් කැලි දමා ආවරණය කර දෙන ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටි අතර, කරව්කැටිය හා උඩකන්ද පාර දෙපස කාණු දෙපැත්ත හා පාරට වැටී ඇති ගස් කොළන් ආදිය සුද්ධ කිරීමට එක් දිනකට කම්කරුවන් යෙදවීම පිනිස ගරු සභාවේ අවධානය යොමු කරන ලෙසත්, නගරයේ ඇති කුඩා අඩුපාඩු සභාවට දැන්වීමෙන් පසු ඒ සඳහා හැකි ඉක්මනින් සේවක මහතුන් අධීක්ෂණයට යවා එදිනෙදාම කටයුතු කිරීමෙන් අපේක්ෂා කලේ නිළධාරින් අපහසුතාවයට පත්කිරීමට නොව, අවශ්‍යතා වෙනුවෙන් ඉක්මනින් ක්‍රියත්මක වීම බවත්, ශ්‍රම දායකත්වය යොදවා කරව්කැටිය මැද පාරේ කාණුව හා පාර සාදාගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබාදෙන ලෙසත් මෙහිදී ඉල්ලා සිටි අතර , සභාවේ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

### *05:10 ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා*

05:10:01 දිවංගත හිටපු ගරු අමාත්‍ය එම්.එල්.එම්.අබුසාළි මැතිතුමාට ගෞරව පිණිස බලංගොඩ නගරයේ ප්‍රධාන වීදියේ අතුරු මාර්ගයක් වන තානායම් පිවිසුම් මාර්ගය එතුමාගේ නමින් නම් කිරීම.

05:10:02 ගොරොක්ගහමඩ සහ දෙහිගස්තලාව ප්‍රදේශයට දැන්වීම් පුවරු 02ක් සවිකිරීම.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් 1977 වර්ෂයේ සිට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස බලංගොඩ පුරවරයට හා රට වෙනුවෙන් විශාල මෙහෙවරක් සිදු කල දිවංගත හිටපු ගරු අමාත්‍ය එම්.එල්.එම්.අබුසාළි මැතිතුමාට සිදුකරන ගෞරවයක් වශයෙන් බලංගොඩ නගරයේ ප්‍රධාන වීදියේ අතුරු මාර්ගයක් වන තානායම් පිවිසුම් මාර්ගය වන ජේ.එෆ්.මාවත එතුමාගේ නමින් නම් කරන ලෙස ඉල්ලා සිටි අතර, නගර ආශ්‍රිතව ස්ථාපිත කර ඇති දැන්වීම් පුවරු මෙන් ගොරොක්ගහමඩ සහ දෙහිගස්තලාව ප්‍රදේශයට දැන්වීම් පුවරු 02ක් සවිකිරීමෙන් පෝස්ටර් ඇලවීමෙන් පරිසරයට වන හානිය වළක්වාගත හැකි බව පෙන්වා දෙන ලදී.

ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමන් විසින් අදහස් දක්වමින් කුමන දේශපාලන මතිමතාන්තර තිබුනද ,බලංගොඩ පුරවරයට අගනා සේවයක් සිදුකරන ලද ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයකු වන දිවංගත හිටපු ගරු අමාත්‍ය එම්.එල්.එම්.අබුසාළි මැතිතුමාට ගෞරවයක් වශයෙන් මාවතක් නම්කිරීම පිළිබඳ යෝජනාව ඉතා වටිනා යෝජනාවක් බව එය ස්ථිර කරමින් පවසා සිටින ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් අදහස් දක්වමින්, ජේ.එෆ්.මාවතේ දෙපස වෙළෙඳ ව්‍යාපාරිකයන් විසින් කරන කඩ පේලියක් ඇති නමුත් වාහන නැවැත්වීම තහනම් පුවරු ස්ථාපිත කර ඇති බැවින් එම ව්‍යාපාර සඳහා අවාසිදායක තත්වයක් උද්ගත වී ඇති බවත්, එමනිසා ජේ.එෆ්.හන්දිය අසලට වාහන නැවැත්වීම සඳහා එම පුවරු ඉවත්කර ඉඩ කඩ සකසා දෙන ලෙසත් පවසා සිටින ලදී. එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් පැවසූ පරිදි ගොරොක්ගහමඩ සහ දෙහිගස්තලාව ප්‍රදේශයේ අනවශ්‍ය ලෙස අමතර පත්ති දැන්වීම්, පෝස්ටර්ස් වැඩි වී ඇති බැවින් එම ප්‍රදේශ සඳහා දැන්වීම් පුවරු ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

සභාවේ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

### *05:11 ගරු නාගරික මන්ත්‍රිනි පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය*

05:11:01 කිරිදිගල තොසිල ගාඩ්න් නිවාසවල කසල එකතු කිරිම.

05:11:02 මාර්ගවලට මුහුණලා ඇති නිවෙස්වල තම සීමාවෙන් පිට (තාප්පය ඉදිරිපස) ගස් සිටුවීම තහනම් කිරීම.

05ඃ11ඃ03 සූරියබල විදුලි පහන් ස්ථාපනය කිරීමට නගර සභා අනුමැතිය ලබාගැනීම.

05ඃ11ඃ04 බලංගොඩ කොලොන්න ජල ව්‍යාපෘතියේ පාර පළුදු කිරීම සඳහා තැන්පතු මුදලක් අයකර ඇතිනම් නිසි ප්‍රමිතියට මාර්ගය සාදා නොමැති ස්ථාන එම තැන්පතු මුදල යොදා නැවත පිළිසකර කිරීම.

ගරු නාගරික මන්ත්‍රිනි පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රිනි පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය කිරිදිගල තොසිල ගාඩ්න් නිවාස 25ක් පමණ ඇති අතර එම නිවාසවල කසල එකතු කිරිම විධිමත් කරදෙන ලෙසත්, මාර්ගවලට මුහුණලා ඇති නිවෙස්වල තම සීමාවෙන් පිට තාප්පය ඉදිරිපස ගස් සිටුවා ඇති හෙයින් අඩි 12ක මාර්ගය අඩි 8 ක් බවට පත් වූ අවස්ථා දක්නට ඇති හෙයින් එම තත්වය නැවැත්වීම සඳහා තම සීමාවෙන් පිට තාප්පය ඉදිරිපස ගස් සිටුවීම තහනම් කිරීමක් නගර සභාව මගින් ක්‍රියාත්මක කිරීම සුදුසු බව පවසා සිටින ලදී.

සූරියබල විදුලි පහන් ස්ථාපනය කිරීමට නගර සභා අනුමැතිය ලබදෙන ලෙස ඉල්ලා සිටි ගරු නාගරික මන්ත්‍රිතුමිය නොමිලේ සෝලා ලයිට් ලබා ගැනීමේ අදහසක් පවතින බවද පවසා සිටින ලදී. එමෙන්ම බලංගොඩ කොලොන්න ජල ව්‍යාපෘතියේ පාර පළුදු කිරීම සඳහා තැන්පතු මුදලක් අයකර ඇතිනම් නිසි ප්‍රමිතියට මාර්ගය සාදා නොමැති ස්ථාන එම තැන්පතු මුදල යොදා නැවත පිළිසකර කර දෙන ලෙස අදාළ ආයතනයට දැන්වීමට හෝ එම තැන්පතු මුදල යොදවා පළුදු කරන ලද ස්ථාන සභාව මගින් සකස් කිරීම සුදුසු බව මෙහිදී පවසා සිටින ලදු ව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රිනි පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ඉහතින් ඉදිරිපත් කරන ලද අවසාන යෝජනාවට අනුව ප්‍රමිතියට මාර්ගය සාදානිම කරන තෙක් කිසි විටෙක එම මුදල නිදහස් නොකිරීම සුදුසු පව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් එම ගැටළුව තමන් විසින්ද නිරීක්ෂනය කර ඇති බවත්,ඔවුන් සැම විටම මාර්ගය පළුදු වෙන පැත්ත පමනක් පිළිසකර කර,මාර්ගය පළුදු කිරීම නිසා මාර්ගයේ අනෙක් පැත්තෙන් වාහන ධාවනය වීම නිසා සිදුවන

පළුදු වීම් පිළිසකර නොකරන බවත්, ප්‍රමිතියට අනුව මාර්ග පිළිසකර කිරීම නිමවන තුරු රැඳවුම් මුදල නිදහස් නොකරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් කරවිකැටිය මාර්ගයේද වැඩ අවසන් කලද මීටර් කණු මාර්ගය තුළට  වීමට සවිකර ඇති බැවින් ධාවනය වෙන වාහනවල පවා ගැටෙන බවත් මේ පිළිබඳවද අධීක්ෂනය කොට සුදුසු පිළියමක් ගත යුතු බවත් පවසා සිටින ලදී. ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් අදහස් දක්වමින් කරවිකැටිය මාර්ගයේ තත්වය ඉතා අසතුටුදායක බවත්, වතුර මාර්ගය දිගේ  ගමන් කරන බැවින් යෑමට නොහැකි තත්වයක් උද්ගතව පවතින බවත් පවසා සිටින ලදී.
ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එන්.පී.වීරසිංහ මැතිතුමා මේ පිළිබඳව අදහස් දක්වමින් මෙම මාර්ගයේ ජල නළ පද්ධතිය නගර සභාව මගින් සකස් කරන ලද්දක් බවත් පසුව එය ජල සම්පත් මණ්ඩලය මගින් පවරා ගන්නා ලද අතර මේ සම්බන්ධව ඉදිරියේදි නිරීක්ෂනය කොට සභාව මැදිහත් වී සුදුසු පියවරක් ගැනීමට තම සහයෝගය ලබා දෙන බවත් පවසා සිටින ලදී.

***05ඃ12 ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා***

05ඃ12ඃ01  වැවවත්ත ප්‍රජා ශාලාව හා ළමා උයන ප්‍රතිසංස්කරණය කිරීම.

ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද වැවවත්ත ප්‍රජා ශාලාව හා ළමා උයන ප්‍රතිසංස්කරණය කිරීමේ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
මේ සම්බන්ධව අදහස් පල කල ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින් වැවවත්ත පෙර පාසල,සමෘද්ධි කාර්යාලය,ග්‍රාම නිළධාරි කාර්යාලය, යනාදි ආයතන රාශියක් සහිත මෙම භූමිය කුඩා දරුවන් හා සාමාන්‍ය මහජනතාව නිරන්තරයෙන් පරිහරනය කරන බැවින් මේ පිළිබඳව ගරු සභාවේ කඩිනම් අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටින ලදී.

මෙහිදී ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ඉහත යෝජනාව සනාථ කරමින් අදහස් දක්වන ලද අතර විරෝධතා නොමැති හෙයින් එම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**06. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

මෙහිදී 2018.07.03/ 2018.07.19 දින පැවති මුදල් හා කර්මාන්ත කමිටු වාර්තා ගරු සභාවට ඉදිරිපත් කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**07. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| පුනරාවර්ථන ලැබීම් | **7,974,234.94** |
| වෙනත් ලැබීම් | **1,533,784.34** |
| මුලු ලැබීම් | **9,508,019.28** |
| පුනරාවර්ථන වියදම් | **7,589,721.95** |
| වෙනත් වියදම් | **3,159,858.59** |
| මුලු වියදම් | **10,749,580.54** |

**ඉන්ධන වාර්තාව සභාවට ඉදිරිපත් කිරිම.**

2018 -07-01 සිට 2018-07-31 දක්වා

| **වාහන අංකය** | **මුළු එකතුව** |
|---|---|
| 150-0248 | 1,370.00 |
| 227-5020 | 34,255.00 |
| 37-7933 | 23,435.00 |
| 56-1906 | 17,440.00 |
| BC-0005 | 32,700.00 |
| DDR0008 | 12,535.00 |
| DPP0006 | 1,370.00 |
| FCON0015 | 2,180.00 |
| FP0002 | 6,060.00 |
| GC 0001 | 12,040.00 |
| GC 0001 | 770.00 |
| GK-1483 | 2,180.00 |

| | |
|---|---|
| GK-6227 | 47,480.00 |
| HF-8952 | 7,920.00 |
| JD-4684 | 3,205.00 |
| LL-2110 | 21,351.00 |
| LL-7688 | 9,650.00 |
| MIXB001 | 1,225.00 |
| ND-5124 | 47,960.00 |
| PF-4006 | 53,192.00 |
| QL-2901 | 5,945.00 |
| RB-4786 | 30,040.00 |
| RB-4786 | 880.00 |
| RC-1107 | 7,420.00 |
| RC-1118 | 12,325.00 |
| RC-8183 | 39,030.00 |
| RD-8000 | 5,450.00 |
| RD-8240 | 45,780.00 |
| SDRR0013 | 1,635.00 |
| RE-2600 | 34,625.00 |
| UQ-1933 | 4,110.00 |
| VI-1833 | 1,096.00 |
| ZA-5039 | 65,400.00 |
| **එකතුව** | **590,684.00** |

**08. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා**

●ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා අදහස් දක්වමින් සභාවේ යෝජනා ක්‍රියාත්මක වීමේ මන්දගාමීත්වයක් දක්නට ලැබෙන බවත්, මෙසේ බොහෝ කාලයක් ගත වීම කණගාටුවට කරුණක් බව පවසා සිටි අතර පෙර මාසික සභා රැස්වීමේදී ඉදිරිපත් කළ පරිදි මාර්ගයක් බාදනය වීමේ ගැටළුව හා අයි.ජී.රෙස්ට් ආශ්‍රිත ප්‍රදේශයේ ගලක් ඉවත් කිරීම යන කරුණු දෙක පිළිබඳ තවමත් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත් , අයාලේ යන සුනඛයන් සම්බන්ධ ගැටළුව පිළිබඳ සභාවේ කඩිනම් අවධානය යොමු කරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

● මේ සඳහා අදහස් දැක්වූ ගරු සභාපතිතුමා විසින් ඉහතින් දැක් වූ කරුණු යෝජනා ලෙස ඉදිරිපත් නොවූ අතර වෙනත් කරුණු ඔස්සේ පවසා සිටින ලද කරුණු බවත් සභාවේ නිළධාරීන් සම්බන්ධ කරගෙන එම අවශ්‍යතා සිදු කර ගන්නා ලෙසත් සභාව නොමග යවන පරිදි ප්‍රකාශ කිරීමෙන් වළකින ලෙසත් පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා</u>

●ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා සිය කතාව ආරම්භ කරමින් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ බලංගොඩ ආසනයේ කොට්ඨාශ 10 න් 7ක් ජයග්‍රහණය කළද අවාසනාවන්ත ලෙස බලය පිහිටුවා ගැනීමට නොහැකි වීම පිළිබඳ කනගාටු වන බව පවසා සිටි අතර මිය ගිය ගරු නාගරික මන්ත්‍රී සුගත් ඉනදිජිත් මැතිතුමාගේ පුරප්පාඩු වූ තනතුරට පක්ෂ නායකත්වය විසින් තම නම තෝරා පත් කර එවූ මේ අවස්ථාවේ මිය ගිය සුගත් මැතිතුමාගේ බිරිඳ, පුතා, දුව ඇතුළු පවුලේ ඥාතීන් සියළුදෙනාට තම බලවත් සංවේගය පිරිනැමීමට මෙය තවත් අවස්ථාවක් කරගන්නා බව පවසා සිටින ලදී.

●එදා මෙදාතුර බලංගොඩ නගර සභාවේ තේරී පත් වූ සභාපති, උප සභාපතිවරුන් සියළුදෙනා සිහිපත් කර සිටි ගරු නාගරික මන්ත්‍රීවරයා තම දයාබර පියා මොහාන් සාලිය එල්ලාවල මැතිතුමා මෙම නගරයට සිදු කරන ලද වටිනා මෙහෙය සිහිපත් කරන ලදී.

●සංහිඳියාවට හොඳම ආදර්ශය සපයන බලංගොඩ නගරය සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව සහෝදරත්වයෙන් එකිනෙකා ආරක්ෂා කර ගනිමින් අතීතයේ සිට මේ දක්වා සංහිඳියාවෙන් ජීවත් වූ බවත්, නගරයේ ශක්තිය වන ව්‍යාපාරික ප්‍රජාවගේ දියුණුව මත නගරය ඉහළට ඔසවා තැබීම තීරණය වන බැවින් සෑමවිටම ව්‍යාපාරික ජනතාව ආරක්ෂා කළ යුතු බවත්, කිසිවිටෙක අසාධාරණ ලෙස කඩකුලී වැඩි කිරීමට ඉඩ දිය නොහැකි බවත්, නගරයේ අලංකාරය වෙනුවෙන් පදික වෙළඳාම ඉවත් කළද මේ වනතුරු වෙළඳ ස්ථානයක් නොමැතිව අසීමිතව දුක් පීඩා විඳින එම වෙළඳුන් පිළිබඳ අවධානය යොමු කරන ලෙසත්, ඉල්ලා සිටින ලදි.

●ළමා උයනේ ආරක්ෂාව සඳහා පොලිසියේ සහාය ලබා ගැනීම උචිත බවත්, තුරු උයන සඳහා අලෙවිසැලක් ඉදි කිරීම ඉතා හොඳ යෝජනාවක් බවත්, ගන්නොරුව ප්‍රදේශයේ පවතින දේශීය ආහාර වෙළඳසැල වැනි ව්‍යාපෘතියක් ආරම්භ කළහොත් කොළඹ බදුලු මාර්ගයේ බැවින් හොඳ ප්‍රතිලාභයක් ලබා ගතහැකි බවත්, පවසා සිටින ලදී. එමෙන්ම තවදුරටත් අදහස් පළ කරන ලද ගරු අකිල එල්ලාවල මැතිතුමා විවෘත එළිමහන් වල, පවතින ව්‍යායාම උපකරණ ස්ථාපිත කිරීම මෙම නගර අලංකරණ සංකල්පයට තවත් ඉවහල් වන ව්‍යාපෘතියක් වනු ඇති බවත්, ඒ පිළිබඳ සිතා බලන ලෙසත් පවසා සිටින ලදී.

●එමෙන්ම ඝනඅපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානය විකල්ප ස්ථානයකට ගෙනයාමට වඩා, වඩාත් උචිත වන්නේ තිබෙන ස්ථානය ක්‍රමවත්ව කළමණාකරණය කර ගැනීම බවත්, කසළ මඟින් විදුලිය උත්පාදනය වන ආයතන පිළිබඳ අසන්නට ලැබී ඇති බවත්, එවන් ක්‍රමවේද සඳහා යාම කෙතරම් ප්‍රායෝගිකවේද යන්න සොයා බැලිය යුතු බවත්, නගරයේ සුනබ ප්‍රශ්නය පිළබඳ අවධානය යොමු කිරීම වැදගත් බවත්, පවසා සිටින ලදී.

●විශේෂ ඉල්ලීමක් ලෙස තම කණ්ඩායමේ සාමාජිකයින් ලබා දෙන සංවර්ධන යෝජනාවල අනන්‍යතාවය රකින ලෙස ඉල්ලා සිටින බවත්, රුපියල් ලක්ෂ දහය මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස ලබා දෙන බවට ප්‍රකාශ කළද, වර්තමානයේ ලක්ෂ හතර දක්වා අඩු වූ එම ප්‍රතිපාදන හෝ ලබා දීම පිළිබඳ ගරු සභාවේ අවධානය යොමු කරන ලෙසත්, මෙහිදී ඉල්ලා සිටින ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රි එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා</u>**

●ෆලීල් හාජ්ජියාර් මාවතේ කසල දමා යන ප්‍රශ්නය දිනෙන් දින උග්‍රවන බවත් මේ සඳහා ප්‍රාදේශීය සභාව සමඟ සාකච්ඡා කර කඩිනමින් විසඳුමක් ලබා දෙන ලෙස ඉල්ලා සිටි ගරු නාගරික මන්ත්‍රී

එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා නගර සීමාව පුළුල් වූ පසු එම ස්ථාන සඳහා වීථි ලාම්පු ස්ථාපිත නොකිරීම, වරිපනම් බදු ගෙවන ජනතාවගේ දෝෂදර්ශනයට ලක් වී ඇති බැවින් එම ස්ථාන කරා වීථි ලාම්පු සවි කිරීම පිළිබඳ ගරු සභාවේ විශේෂ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටින ලදී.

●එමෙන්ම බලංගොඩ පදික වෙළදාමේ නිරත වෙන ලද පදික වෙළදුන්ගේ දුක, සංවේගය, චෝදනා, මැසිවිලි නිරන්තරයෙන් අසන්නට ලැබෙන බවත් ඔවුන්ගේ ගැටළු පිළිබඳ සානුකම්පිතව සොයා බලා අවශ්‍ය කටයුතු කඩිනමින් ගන්නා ලෙස ගරු සභාවෙන් ගෞරවයෙන් ඉල්ලා සිටින බවත් මෙහිදී පවසා සිටින ලදී.

**ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා**

●ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් පැවසූ පරිදි ෆලීල් හාජියාර් මාවතේ කසළ දමායෑමේ ගැටලුවක් පිළිබඳ තමන් සමග ද මහජනතාව කරුණු පවසා ඇති බවත්, මෙවැනිම තත්ත්වයක් මිරිස්වත්ත හා දෙහිගස්තලාව පෙදෙස්වල ද දක්නට ලැබෙන බැවින් මේ සඳහා සුදුසු පිළියමක් කඩිනමින් යෙදිය යුතු බවත් පෙන්වා දෙන ලදි.

●එමෙන්ම අභිනවයෙන් මහ සභා රැස්වීමට සපැමිණි අකිල එල්ලාවල මැතිතුමාට සුභාශිංශන පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බව පවසා සිටි අතර බළන්ගොඩ නගරයේ සංවර්ධන කටයුතු උදෙසා එතුමාගේ වටිනා අදහස් හා අත්දැකීම් ලබාදෙන ලෙස ගරු උප සභාපතිතුමන් විසින් මෙහිදී ඉල්ලා සිටින ලදි.

●සංවර්ධනයට මුදල් ලැබේද යන්න ගැටලුවක් මතුවී තිබෙන නමුත් සංවර්ධනය උදෙසා ගරු අධිකරණ අමාත්‍ය තලතා අතුකෝරාළ මැතිතුමිය හා ගරු අමාත්‍ය කරුණාරත්න පරණවිතාන මැතිතුමන් විසින් විශාල මුදලක් බළන්ගොඩ නගරය වෙත ලබාදී ඇති බවත්, පක්ෂ භේදයකින් තොරව සියලු දෙනා එක්ව යහපත් තීන්දු තීරණ ගතහොත් බළන්ගොඩ නගරයේ බඳු ගෙවන ජනතාව තෘප්තිමත් වන පරිදි අගනා සංවර්ධනයක් උදාකරලීමේ හැකියාව පවතින බව ප්‍රකාශ කර සිටින ලදි.

**ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය**

●ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිනිය අදහස් දක්වමින් රැකියා විරහිත අසරණ කාන්තාවන් වෙනුවෙන් ස්වයං රැකියා අවස්ථාවක් ඇති කිරීමේ ඉඩකඩ ලැබී ඇති බවත්, එහිදී ෂොපින් කවර වෙනුවට දිරා යන බෑග් මල්ලක් හඳුන්වා දී ඒ සඳහා මැෂින් භාවිත කරමින් බෑග් මැසීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන බවත් දන්වන ලදි.

●එසේම කාන්තාවන් 10 දෙනෙකුට පුහුණුවක් ලබාදීමට බලාපොරොත්තු වන බවත්, ඒ සඳහා සුදුසු කාන්තාවන් සිටීනම් සහභාගි කරවන මෙන් පක්ෂ භේදයකින් තොරව සැමට විවෘත ආරාධනයක් කරන

බවත් පවසා සිටි ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිනිය ගරු සභාව හරහා එම නිෂ්පාදන සඳහා වෙළඳපළක් නිර්මාණය කිරීමේ බලාපොරොත්තුවක් පවතින බවද දන්වා සිටින ලදි.

**<u>ගරු නාගරික මන්ත්‍රිනි ශාන්තිලේඛා මැතිතුමිය</u>**

●ප්‍රතිපාදන ලබාගැනීමට ගතවන කාලයත් සමග ගරු සභාවට ලබාදුන් යෝජනා වල ප්‍රමුඛතාවය විටින් විට වෙනස් කිරීමට සිදුවන බවත්, තම පෞද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන යොදවා නිවාසාධාර ලබාදීමට බලාපොරොත්තු වන බවත් පවා සිටි ගරු නාගරික මන්ත්‍රිනී එම්. ශාන්තිලේඛා මැතිතුමිය තම මන්ත්‍රී දීමනාව ලබාදී පෞද්ගලික ව නිවසක් සෑදීමේ වටිනා කටයුත්තකට සහයෝගය ලබාදීමට හැකිවූ බවත් පවසා සිටින ලදි.

●එමෙන්ම ප්‍රතිපාදන ලැබෙන තෙක් නොසිට බාහිර සමාජයේ හා අවට පරිසරයේ සහයෝගය ලබාගෙන කළ හැකි කාර්යය භාරයන් ඉමහත් බව පෙන්වා දුන් ගරු නාගරික මන්ත්‍රීතුමිය ඒ සඳහා සෑම විටම තමා දක්ෂ හා නිර්මාණශීලී විය යුතු බව පෙන්වා දෙන ලදි.

●පල්ලෙකුඹුර නිවාස 05 කට නළ ජලය ලබාගැනීමට හා කුමාරගම ආගමික ස්ථානයකට විදුලිය ලබාගැනීමේ ගැටලු පවතින බැවින් ඒ සඳහා ගරු සභාව මැදිහත් වී විසඳුමක් ලබාදෙන ලෙස ගරු නාගරික මන්ත්‍රිනී එම්. ශාන්තිලේඛා මැතිතුමිය විසින් ඉල්ලා සිටින ලදි.

●එසේම 25% කාන්තා නියෝජනය තුළින් 1900 ආසන්න කාන්තාවන් පිරිසකට පළාත් පාලන ආයතන නියෝජනය කිරීමට ලැබුන බවත් ඉන් කාන්තාවන් උපරිම ප්‍රයෝජන ගැනීමට සැමවිටම නිර්මාණශීලී විය යුතු බවත් පවසා සිටින ලදි.

**<u>ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා</u>**

●ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් අදහස් දක්වමින් ගරු සභාවේ සියලු යෝජනා සඳහා හෙට දින විසඳුම් සෙවීමට අපහසු වුවද විරුද්ධ පක්ෂය නිසාදෝ යෝජනා ක්‍රියාත්මක කිරීමේ මන්දගාමී තත්ත්වයක් දක්නට ලැබෙන බව ද නගරයේ අඩුපාඩු දක්නට ලැබේ නම් ඒවා ගරු සභාවට යොමුකිරීමට සිදුවන බවද පැහැදිලි කරන ලදි.

●ගරු නාගරික මන්ත්‍රි නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා පැවසූ පරිදි නගරයේ සංවර්ධනයට විශාල මුදලක් ලැබී තිබෙන බැවින් ඉන් ක්‍රීඩාංගනය සංවර්ධනය කරන මෙන් ඉල්ලා සිටින බව පවසා සිටි

ගරු නාගරික මන්ත්‍රීතුමන් විසින් නගරයේ සිදු කෙරෙන විශේෂ වැඩසටහන් සඳහා තමන්වද සහභාගි කරවා ගන්නා ලෙස මෙහිදී ඉල්ලා සිටින ලදි.

●එමෙන්ම ඉදිරියේදී ලබාදීමට නියමිත පදික වෙළඳසැල් ලබාදීමේ වැඩපිළිවෙලේදී සාධාරණ පරිදි ක්‍රියා කරනු ඇතැයි උදක්ම අපේක්ෂා කරන බවත්, හැකි ඉක්මනින් එම කටයුතු අවසන් කිරීම පිලීබඳ අවධානය යොමු කරන මෙන්ද ඉල්ලා සිටින ලදි.

<u>**ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා**</u>

●අභිනවයෙන් බළන්ගොඩ නගර සභාවට තේරී පත් වූ අකිල එල්ලාවල මැතිතුමාට සුභ පතමින්, එතුමාට පළාත් සභාවෙන් නොනැවතී, පාර්ලිමේන්තුව දක්වා තේරීපත්වී රටට විශාල සේවාවක් ඉටු කිරීමේ හැකියාව ලැබේවායි පවසමින් සිය කථාව ආරම්භ කළ ගරු නාගරික මන්ත්‍රීතුමන් විසින් දිවංගත මොහාන් එල්ලාවල මැතිතුමා නමින් නම්කර ඇති මාර්ගයේ එතුමාගේ නාමය සහිත පුවරුව ජනතාවගේ අවධානයට පත්වන පරිදි ස්ථාපිත කිරීම විශාල යුතුකමක් බව පෙන්වා දෙන ලදි.

●එමෙන්ම ලක්ෂ 04 ක මුදලක් ප්‍රතිපාදන ලෙස තමන් විසින් ලබාදුන් සංවර්ධන යෝජනා දෙක ක්‍රියාත්මක කිරීමට දුන් සහයෝගයට ස්තුතිවන්ත වන බව ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් වැඩිදුරටත් පවසා සිටින ලදි.

<u>***ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා***</u>

●ප්‍රථමයෙන් කණ්ඩායම් ඡායාරූපයක් ලබාගැනීමේ කටයුතු සංවිධානය කරදුන් ලේකම්තුමියට ස්තුතිවන්ත වන බව පැවසූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් ගරු සභාවේ සිටින සියළුම මන්ත්‍රීවරු ගරු සභාවට සම්පතක් බඳු අකිල එල්ලාවල මැතිතුමා ආරක්ෂා කල යුතු බවත්, සාර්ථක මහජන නියෝජිතයෙක් ලෙස ඉදිරියෙන් ඉදිරියට යාමේ හැකියාව ලැබේවායි එතුමාට සුභ පතන බව පවසා සිටින ලදි.

●ඉන්දුනීසියාවේ සුරබයා නගරයේ චාරිකාව යාමට නියමිත නියෝජිතයන් දෙපළට සුභ පතන අතරම ගරු සභාවේ දියුණුවට එමගින් යහපතක් වනු ඇතැයි අපේක්ෂා කරන බවත් චක්‍රලේඛ අභිබවා නොගොස් සියලු ගෙවීම් ඒ අනුව සිදුකිරීමට තම කණ්ඩායමේ අනුමැතිය ලබාදෙන බවත්,

රැකියා සඳහා බඳවා ගැනීමේදී ඒ සඳහා නියම සුදුස්සන් යොදවා බඳවා ගැනීම සිදුකරන ලෙසත් එතුමන් විසින් ප්‍රකාශ කර සිටින ලදි.

**<u>ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. පී. වීරසිංහ මැතිතුමා</u>**

●ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. පී. වීරසිංහ මැතිතුමන් විසින් අදහස් දක්වමින් තමාගේ ධූරකාලය තුළ විශාල පිරිසකට රැකියා අවස්ථා ලබාදුන් බවත්, ඒ කිසිවෙකුගේ බලයෙන් ඡන්දය ඉල්ලා නොමැති බවත් පවසා සිටි අතර නූතනයේ රටේ පවතින සම්මුතිවාදී ආණ්ඩුවට සහාය ලබාදෙමින් ඉදිරියේදී කටයුතු කරගෙන යන බවත් දන්වා සිටින ලදි.

●ගරු සභාවේ ප්‍රමාද වන සංවර්ධන වැඩකටයුතු කොන්ත්‍රාත් මගින් කඩිනමින් සිදුකර ගැනීමට හැකිබව පෙන්වා දුන් ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. පී. වීරසිංහ මැතිතුමන් විසින් බළන්ගොඩ නගරයේ සංවර්ධන කටයුතු රාශියක් ඉදිරියේදී සිදුකිරීමට අපේක්ෂා කරන බවත්, ඒ සඳහා තමාගේ සහයෝගය ලබාදීම නිරන්තරව සිදුකරන බවත් ප්‍රකාශ කරන ලදි.

## 09. අවසානය

- අද දින පැවති දීර්ඝ සභාවේ කටයුතු සාර්ථකව කර ගැනීමට සහයෝගය දක්වන ලද සියළුම දෙනාට ස්තුතිවන්ත වන බවත් මහජනතාවට සේවය කිරීම පරම අභිලාෂය කොට ගෙන ක්‍රියාකරන මෙන් සැමගෙන් ඉල්ලා සිටින බව පවසමින් ගරු සභාපතිතුමන් විසින් සභාවේ වැඩකටයුතු ප.ව. 5.00 ට පමණ අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.